# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1709/3 – 2011 ජුනි 06 වැනි සඳුදා – 2011.06.06

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, ඒවා ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

ඌව පළාතේ බදුල්ල දිස්ත්‍රික්කයේ, බදුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, රිල්පොල කෝරලයේ සුළු කොට්ඨාසයේ, අළුත්වෙලගම (කොට්ඨාස අංක 07, වෙලේකඩේ, බදුල්ල මහ නගර සභා සීමාව තුළ) ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙළ කරන ලද අංක B/BDL/2009/365 හා 2010.02.25 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සඳහන් ප්‍රමාණයෙන් හෙක්. 0.1325 ක් පමණ වන කුඩාමුත්තෙට්ටුව නමැති ඉඩම (කොටස් 01).

01. කැබලි අක්ෂර ‘ඒ’ – කුඩාමුත්තෙට්ටුව, වරි. අංකය නොදනී – **ප්‍රමාණය:** හෙක්. 0.1325

උතුරට: කුඩාමුත්තෙට්ටුව, වත්ත, වී. කේ. ශිව සුබ්‍රමනියම් සහ තවත් අය; නැගෙනහිරට: කුඩාමුත්තෙට්ටුව, ගෙවත්ත, වී. කේ. ශිව සුබ්‍රමනියම් සහ තවත් අය සහ ගොවිජන සේවා දෙපාර්තමේන්තුව; දකුණට: කුඩාමුත්තෙට්ටුව, ගෙවත්ත, ගොවිජන සේවා දෙපාර්තමේන්තුව සහ මාර්ගය; බටහිරට: කැප්පෙටිපොල පාර.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍ය.

යොමු අංකය: එල්ඩී/05/2009/පීසී/237.
2010 සැප්තැම්බර් මස 30 වන දින,
80/5, “ගොවිජන මන්දිරය”,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

06 - 409